# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/28 - 2024 මැයි මස 08 වැනි බදාදා - 2024.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සහ මාහේන්වත්ත, පිටිපන, හෝමාගම යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 නොවැම්බර් මස 03 දින අංක 2356/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "නීතිය සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 10 වන ස්ථරයේ) අධ්‍යාපන කළමනාකරණ සහ නායකත්වය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය සම්බන්ධයෙන්,

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් පිළිගත් අදාළ විෂය ක්ෂේත්‍රයෙන් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් වන පරිදි ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ;

(ආ) අදාළ විෂය ක්ෂේත්‍රයෙන් SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයක යෝග්‍යතාවයක් ලබා තිබීම හෝ;

(ඇ) SLQF සයවැනි හෝ ඉහළ ස්ථරයකට සමාන වන වෘත්තීය යෝග්‍යතාවයක් ලබා තිබීම හෝ;

1A - PG 6720 — 284 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් නියම කරන ලද පරිදි 0-4 පරිමාණයෙන් අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය 3.00 හෝ ඉහල ප්‍රමාණයක් සමග NVQ හත්වැනි ස්ථරය සම්පූර්ණ කර තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

## II වන උපලේඛනය

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අධ්‍යාපන කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය | එම්එඩ් (අධ්‍යාපන කළමනාකරණය හා නායකත්වය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2024 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0067

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.